4

# එඩුවාර්ඩ් මනේ ශිල්පියාගේ සිතුවම් සඳහා යොදා ගත් වස්තු විෂයයන්

*බී. එම්. අමාලි රසාංගිකා* [1]
HU/2011/0820

දහ නව වන සියවසේ තුන්වන විප්ලවකාරී රැල්ල සේ සැලකිය හැකි උපස්ථිතිවාදී චිත්‍ර කලා ව්‍යාපාරය බිහිවීමට අවශ්‍ය සමීපතම කාර්යය ඉටුවූයේ එඩුවාර්ඩ් මනේ (Edouard Manet, 1832-1883) සහ ඔහුගේ මිතුරන් අතිනි. මනේ පූර්ණ උපස්ථිතිවාදියෙකු ලෙස නම් කිරීමට නොහැකි වුව ද ඔහු උපස්ථිතිවාදීන්ගේ චිත්‍රමය ප්‍රවිශ්ටය පිළිගත් අතර ඒ පිළිබඳ පැහැදිලි හැඟීමකින් ද විසීය. ඔහුගේ සිතුවම් සඳහා යොදාගත් වස්තු විෂයයන් පිළිබඳ අධ්‍යයනයේ දී ද්විතියික මූලාශ්‍ර ලෙස පුස්තකාල පරිශීලනයත් අන්තර්ජාලය භාවිතයත් දැක්විය හැකිය. යථාර්ථවාදී සිත්තරෙකු වන ගුස්ටාව් කුර්බේගේ (Gustave Courbet, 1819-1877) චිත්‍ර ව්‍යාපෘතිය ඉතා අවධාරණයෙන් වැළඳගත් මනේ සාම්ප්‍රදායික ක්‍රමයේ ඇති පිළුණු සහ අරුත්සුන් චිත්‍ර සම්මුති විචාරයට ලක් කරන ලදී. මනේ යථාවාදය සහ උපස්ථිතිවාදය අතර සම්බන්ධතාව ඇති කළ චරිතය හෙවත් පුරුක ලෙස සැලකිය හැකි ය. මොහුගේ චිත්‍ර තමා අවට වූ ලෝකය පිළිබඳ ඇති ඉතා නිවැරදි වාර්තාවක් ලෙස සැලකිය හැකි ය. පැරීසියානු මංමාවත්, උයන්, කෝපි කඩ, තරුණ මහත්වරුන්, වැදගත් වෛශ්‍යාවන් ආදී අංග මොහු චිත්‍රණය කර ඇත. මනේ චිත්‍ර ශිල්පී චරිතයක් ලෙස ඉතා සාමාන්‍ය "ජන චරිතයක්" විය. ඔහු ස්වකීය නාගරික පරිසරය දෙස බොහෝ දුරට දුරස්ථ වූ නිරීක්ෂකයෙකු ලෙස බැලූ අතර ඒ හා භාවමය ලෙස බැඳීම චිත්‍රයේ මුඛ්‍ය අර්ථය බවට පත් නොකිරීමට වග බලාගන්නේ යැයි කිව හැකිය. උපස්ථිතිවාදී කලාව තුළ සුවිශේෂී සංධිස්ථානයක් සනිටුහන් කළ සිත්තරෙකු ලෙස එඩුවාර්ඩ් මනේ ශිල්පියා අදටත් ලොව ප්‍රචලිත වනුයේ ඔහුගේ මෙම සුවිශේෂී සිතුවම් නිර්මාණය සඳහා යොදා ගත් වස්තු විෂයන් නිසාවෙනි.

ප්‍රමුඛ පදඃ චිත්‍ර කලා, වස්තුවිෂය, උපස්ථිතිවාදය

*1 දෘශ්‍යකලා හා සැලසුම්කරණය (විශේෂවේදී) තෙවන වසර*